## සේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය
## வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – மீ ஓய
## Resident Project Management Office – Mee Oya

වාරිමාර්ග කළමනාකරණ අංශය
මී ඔය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
கல்கமுவ
நீர்ப்பாசன மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

ගල්ගමුව
මී ඔය
Mee Oya
Galgamuwa

19 SEP 2017
වාරිමාර්ග කළමනාකරණ අංශය

මගේ අංකය / எனது இல. / My Ref No: 018/3/1/3
ඔබේ අංකය / உமது இல / Your Ref No:
දිනය / திகதி / Date: 2017.08.17

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම
රජයේ නිලධාරි මහතුන් සියලුම ගොවි සංවිධාන
නියෝජිතවරුන් වෙත

මී ඔය ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව-2017 අගෝස්තු

සහභාගි වූ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | D.M.K.H.දිසානායක මයා | නියෝ:ව්‍යා:කළමණාකරු | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 02 | J.M.N.S.ජයසූරිය මෙනවිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 03 | M.N.A.N.කුමාරි මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 04 | K.P.K.S.පතිරණ මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 05 | B.M.P.P රණසිංහ මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 06 | Y.D.C.R.ජයසේන මයා | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය නිලධාරි කාර්යාලය |
| 07 | R.M.G.ජිනනායක මයා | සහකාර කළමණාකරු | ප්‍රාදේශීයසංවර්ධනබැංකුව-අඹන්පොල |
| 08 | H.M.C.B.හේරත් මයා | කළමණාකරු | ප්‍රාදේශීයසංවර්ධනබැංකුව-ගල්ගමුව |
| 09 | D.M.කමලාවතී මිය | කෘ:පා:නි:ස | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව |
| 10 | N.P.චන්ද්‍රලතා මිය | කෘ:පා:නි:ස | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව |
| 11 | T.M.S.K. මැණිකේ මිය | කෘ:පා:නි:ස | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව |
| 12 | R.M.[illegible] කාන්ති මිය | කෘ:පා:නි:ස | ගොවිජනසේවා දෙපාර්තමේන්තුව |

සහභාගි වූ ගොවි නියෝජිතවරුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | R.D.සෝමරත්න මයා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 02 | G.M.කිරිබංඩා මයා | සභාපති | අභය ගොවි සංවිධානය |
| 03 | H.M.T.මුතුබංඩා මයා | ලේකම් | අභය ගොවි සංවිධානය |
| 04 | W.M.දිසානායක මයා | භාණ්ඩාගාරික | අභය ගොවි සංවිධානය |
| 05 | N.P.හින්බංඩා මයා | සභාපති | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 06 | R.D.නිමල් සූරියරත්න මයා | භාණ්ඩාගාරික | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 07 | I.A.පබිලිස් මයා | සභාපති | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 08 | W.V.ආරියසේන මයා | භාණ්ඩාගාරික | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 09 | D.නාහිඳු මයා | ලේකම් | ධාතුසේන ගොවි සංවිධානය |
| 10 | W.සුජිත් දිනසේන මයා | සභාපති | යාය 03 ගොවි සංවිධානය |
| 11 | H.H.කරුණාරත්න මයා | සභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 12 | H.M.රත්නායක බංඩාර මයා | ලේකම් | යාය 04 ගොවි සංවිධානය |
| 13 | H.A.L.කරුණාතිලක මයා | උපසභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 14 | P.M.ශ්‍රීලානන්ද වීරසිංහ මයා | සභාපති | යාය 05 ගොවි සංවිධානය |
| 15 | H.M.සෝමපාල මයා | ලේකම් | යාය 05 ගොවි සංවිධානය |
| 16 | W.ආරියරත්න මයා | සභාපති | යාය 06 ගොවි සංවිධානය |
| 17 | A.K.ගුණසේන මයා | ලේකම් | යාය 06 ගොවි සංවිධානය |
| 18 | T.B.හේරත්බණ්ඩා මයා | සභාපති | පුරාණගම ගොවි සංවිධානය |
| 19 | B.M.C.බාලසූරිය මයා | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරු ව මී ඔය ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 අගෝස්තු මස 17 වන දින පෙ.ව 9:00 ට මී ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී ව්‍යාපාර කමිටු රැස්වීම පටන්ගත ලදී. පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරණ ලදී.

පසුගිය කමිටු වාර්තාව සමාලෝචනය හා එකඟතා ලබා ගැනීම

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

01.ආයතන සංවර්ධන කටයුතු- සංවර්ධන නිලධාරි

❖ පසුගිය මාසයේ ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | මහ සභා පැවැත්වීම | 01 |
| 02 | කාරක සභා පැවැත්වීම | 12 |
| 03 | මුදල් සාරාංශ ලබා දීම | 16 |
| 04 | නිලවරණ පැවැත්වීම | 01 |

❖ ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත මහ සභා /කාරක සභා

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| මහ සභා පැවැත්වීම | 01 | ජන්:ව්‍යා:කළ/සං:සභ/ සං:නි |
| කාරක සභා පැවැත්වීම | 16 | එම |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | එම |

- 2017 වර්ෂයට අදාලව පැවැත්වීමට නියමිතව තිබූ නිලවරණ සියල්ල මේ වන විට පවත්වා අවසන් බව පැවසීය.
- පාලුකඩවල යාය 06 ගොවි සංවිධානයේ දී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ද පැවැත්වූ බව පැවසීය.
- ගොවි කාන්තාවන් සදහා වූ මැහුම් පුහුණු වැඩසටහනක් 2017.08.02 වන දින පාලුකඩවල යාය 03 ගොවි සංවිධානයේ දී සාර්ථකව පවත්වා අවසන් කළ බව පැවසීය.

නෝවාසික ව්‍යාපාර කළමණාකරු

- ගොවි සංවිධාන කාරක සභා වාර්තා පිටපත් කාර්යාලයට ලබා දීමේදී ගොවි සංවිධාන කාරක සභා වාර්තා පොතෙහි ලියන ලද වාර්තාවේ ම ඡායා පිටපතක් ලබා දිය යුතු බවත් එය සත්‍ය පිටපතක් බවට සභාපති සහ ලේකම් අත්සන් කර තිබිය යුතු බවත් පැවසූ අතර මුදල් නිදහස් කර ගැනීමට පැමිණීමේදී අනිවාර්යයෙන්ම එවැනි අංගසම්පූර්ණ සත්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු බවත් පැවසීය.
- ගොවි සංවිධානවල කෙත් ඇළ නියෝජිතයින් පත් කිරිමේදී කෙත් ඇළවල් කිහිපයකට එක් නියෝජිතයකු පත් කර ඇති බවට පසුගිය නිලවරණ වලදී පෙනී ගිය බවත් එම හේතුව නිසාවෙන් ගොවි සංවිධාන නියෝජිත මහතුන් සංඛ්‍යාව අඩු වී ගොවි සංවිධාන සංකෝචනය වී ඇති බවක් පෙනී ගිය බව පැවසූ අතර එම ක්‍රමය වෙනස් කර කෙත් ඇළෙහි ගොවීන් සංඛ්‍යාව හා කුඹුරු අක්කර ප්‍රමාණය පිළිබදව සලකා බලා නියෝජිතයින් පත් කිරීම සිද කළ යුතු බව ප්‍රකාශ කළේය.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | යෝජනාව | තීරණය |
|---|---|---|
| ගරු සභාපති යාය 05 ගොවි සංවිධානය සී.එම් ලීලානන්ද වීරසිංහ මහතා | -එක් නියෝජිත මහතකුට සිටිය යුතු අවම ගොවීන් සංඛ්‍යාව කොපමණදැයි විමසීය. | -අවම වශයෙන් එක් නියෝජිත මහතකුට ගොවීන් 6-8 ක ප්‍රමාණයක් සිටිය යුතු බව නෝවාසික ව්‍යාපාර කළමණාකරු පැවසීය. |
| ගරු සභාපති යාය 04 ගොවි සංවිධානය එච්.එච් කරුණාරත්න මහතා | -නියෝජිත මහතුන් පත් කිරීමට අදාල සැලැස්මක් කාර්යාලය සතුව පවතීද යන්න විමසීය | -දැනට එවැනි සැලැස්මක් කාර්යාලයේ නොමැති බවත් සියලු දෙනා සාකච්ඡා කර එවැනි සැලැස්මක් සකස ගත යුතු බවත් නෝවාසික ව්‍යාපාර කළමණාකරු පැවසීය. |

වාරිමාර්ග කාර්යාලයෙන් ව්‍යාපාර කමිටු රැස්වීම සඳහා සහභාගීත්වයක් නොවූ අතර වාරිමාර්ග ගැටලු ඇත් නම් ඉදිරිපත් කරණ ලෙසට වාරිමාර්ග ඉංජිනේරුතුමන් දැන්වූ බවත් මීලගට ඒ සඳහා අවස්ථාව ලබා දෙන බවත් ගෝවාසික ව්‍යාපාර කළමණාකාරු පැවසීය.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | ගැටලුව | වගකීම | විසඳුම |
|---|---|---|---|
| ගරු සභාපති සය 05 ගොවි සංවිධානය පී.එම් ප්‍රියානන්ද තිරසිංහ මහතා | -ඉදිරි මාස් කන්නය සඳහා කල්තියා සූදානම් වීම කල යුතු බවත් කන්න සූදානම් වීම සඳහා ගොවි සංවිධාන වෙනුවෙන් ඇලවේලි නඩත්තුව සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බව ගොවි සංවිධාන වෙනුවෙන් ගොවි සංවිධානවලට වාරිමාර්ග කාර්යාලයෙන් ලබා දෙන මෙහෙයුම් නඩත්තු මුදල් ප්‍රමාණය පිළිබඳව ද දැන ගැනීමට අවශ්‍ය බවද පවසන ලදි<br>-සියඹලාන්ගමුව ඇළ හරස් කර ඉදිකරණ ඇලෙහි වර්තමාන තත්වය දැනගැනීමට අවශ්‍ය බවද පැවසීය.<br>-දැනට ලැබෙන වැසි රටාව අනුව මාස් කන්නයේ වගාව පිළිබඳවද විශ්වාසය තැබීම අපහසු බවත් කුමන හේතුවක් මත හෝ මාස් කන්නයේ කුඹුරු වගාව සිදු නොවුනහොත් ජනවාරි පෙබරවාරි මාස වන විට වගාවක් සිදු කිරීම සඳහා කුමන හෝ ක්‍රමයක් අනුගමනය කිරීමට සූදානම් විය යුතු බවත් එමෙන්ම ඉදිරි කන්නය සඳහා පෙර කන්න රැස්වීම පවත්වා වගල් නොමැති වැලි සහිත කුඹුරුවල කැකුලන් වී වගාව සුදුසු බවත් එහිදී වගා බිම් සැකසීම හෝ පැරණි බිම් ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රමවේදවලට යාමට සූදානම්ව සිටිය යුතු බවත් පැවසීය. | වාරි:ඉංජි/ඉංජි:සහ: | - මෙම ඉදිරිපත් කළ අදහස් හා ගැටලු ඉංජිනේරුතු මන් වෙත ඉදිරිපත් කරණ බවට නේවාසික ව්‍යාපාර කළමණාකා රු පැවසීය. |
| ගරු සභාපති සය 03 ගොවි සංවිධානය ඩබ්.ලිව් සුජිත් දිනයෝෂ මහතා | -ප්‍රධාන දකුණු ඇළ මාර්ගය ශේෂ්‍යර් කර සකස් කර දීමට වාරිමාර්ග කාර්යාලය වාරිමාර්ග ට වාරිමාර්ග ඇමතිතුමන් දැනුම් දුන්නද එය සිදු නොවූ බව පැවසිය. | වාරි:ඉංජි/ඉංජි:සහ: | |
| ගරු සභාපති සය 04 ගොවි සංවිධානය එච්.එම් කරුණාරත්න මහතා | -වැලිහිද්දැවේ මඩ හොරොව්වේ ඇති සිදුර වැසීම පිළිබඳව ලිඛිත මගින් ඉල්ලීම් කළද මෙතෙක් එය වාරිමාර්ග කාර්යාලයෙන් සිදු නොවූ බවත් මෙම වගා කන්නය ආරම්භ කිරීමට පෙරවත් එය සකස් කර දෙන ලෙස හැකිනා ඉල්ලීම් කරන ලදී. | වාරි:ඉංජි/ඉංජි:සහ: | |
| ගරු සභාපති අභය ගොවි සංවිධානය ජී.එම් තිරිබංඩා මහතා | -අබකොළවැව ජලාශයේ වගාවන් සඳහා ජලය ලබා දීම පසුගිය දිනවල සිදුවූ බවත් එම වගාවන් ව්‍යාපාර කමිටුවේ අනුමැතිය සහිතව වගා කළ ඒවා නොවන බවත් දැන්වීය. | වාරි:ඉංජි/ඉංජි:සහ: | - මෙම ඉදිරිපත් කළ අදහස් හා ගැටලු ඉංජිනේරුතු මන් වෙත |
| ගරු සභාපති | - අබකොළවැව ජලාශයෙන් ජලය | වාරි:ඉංජි/ඉංජි:සහ: | |

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் விவசாய அமைச்சு Ministry of Irrigation & Agriculture
වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
Irrigation Management Division

තැ.පෙ. 1702
වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල
බෞද්ධාලෝක මාවත, කොළඹ 07

த.பெ. 1702
நீர்ப்பாசனத் திணைக்கள கட்டிடம்
பௌத்தலோக்க மாவத்தை, கொழும்பு 07.

P.O. Box 1702
Irrigation Department Building
Bauddhaloka Mawatha, Colombo 07.

03. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම
කෘෂිකර්ම උපදේශක ගේ ...

මගේ අංකය / எனது இல. / My Ref No: 10/3/4/22 - පොදු
ඔබේ අංකය / உமது இல. / Your Ref No:
දිනය / திகதி / Date: 2017.02.

- 2017 යල් කන්නයේ වගාව ව්‍යවසායකත්ව ගොවීන් විසින් රටකජු වගාව සාර්ථකව සිදු කළ බවත් අස්වැන්න රටකජු අස්කරයට කිලෝ ග්‍රෑම් 1280ක් පමණ වූ බවත් අත්හිවාරම් රටකජු කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 340ක මිළකටත් ලියාපදිංචි රටකජු කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 300ක මිළකටත් අලෙවි කළ බව පැවසීය.
- 2017/18 මාස් කන්නයේ වී වගාව සිදුකිරීමේදී සැප්තැම්බර් මස අවසානයේදී හෝ ඔක්තෝබර් මස මුල් කාල සීමාවේදී ලැබෙන වර්ෂාවත් සමග වැලි සහිත කුඹුරුවල කැකුළන් වී වගාව සිදුකළ හැකි බවත් ගොඩ ඉඩම්වල රටකජු, බඩඉරිඟු සිටුවීම කළ හැකි බවත් ජල චක්‍රය අසමතුලිත බැවින් භූගත ජලය මතුපිටට ගෙන ඒම සඳහා ක්‍රියාත්මක විය යුතු බවත් පැවසීය.
- මේ වන විට බඩඉරිඟු සම්පූර්ණ ශාකයම කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 8ක මිලකට සත්ව ... කාරණ ලෙයත් දැක්වීය.
- අකරගල්ල ප්‍රදේශයේදී ... රෝග පිළිබඳව ... බවත් එවැනි වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවය ඇති ගොවීන් සිටි නම් තම ප්‍රදේශයට ... බව පැවසීය.

**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**

**<u>මාධ්‍ය සංචාරය, මින්නේරිය ව්‍යාපාරය - 2017.03. 07 සිට 08 දක්වා</u>**

**මින්නේරිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ චාරිකාවක් 2017.03.07 දින සිට 2017.03.08 දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇත.ඒ සඳහා ඔබ ආයතනයේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී උපුල් ජනක ජයසිංහ මහතා සහභාගි කරවන මෙන් කාරුණිකව ඉල්ලමි.**

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

**චන්ද්‍රිකා වී ඇතුගල**
**අධ්‍යක්ෂ**
**වාරිමාර්ග කළමනාකරණ අංශය**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | තීරණය |
|---|---|---|
| ගරු සභාපති යාය 05 ගොවි සංවිධානය පී.එම් උපානන්ද වීරසිංහ මහතා | -දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දී දැනුවත් කිරීම සිදුවන ආකාරයට වැහි ආවරණ කට්ටල, ආරක්ෂිත කෘෂි දැල්, පැල විසිරුම් තාක්ෂණය සඳහා අවශ්‍ය තැටි ආදිය සඳහා ප්‍රතිපාදන වෙන් කරණු ලබන්නේ සුලු වාරි සඳහාද මහා වාරි සඳහා ද යන්න විමසීය.<br>-මාස් කන්නයේ වගාව සඳහා අවශ්‍ය බිත්තර වී සපයා ගැනීමේ දී ගැටලු මතු වන බැවින් ඒ සඳහා මැදිහත් වන ලෙසත් ඉල්ලා සිටින ලදී. | -පසුගිය කන්නයේ එම උපකරණ ලබා දීම සිදු කළ අතර සුලු වාරිවලට පමණක් නොව මහා වාරි වලටද මෙම උපකරණ ලබා ගත හැකි බැවින් එම උපකරණ වගාවට අවශ්‍ය උපකරණ පිළිබඳව ලැයිස්තු <u>මගින් කෘෂිකර්ම අවශ්‍ය අවශ්‍ය ගොවීන් සිටී නම් අවශ්‍ය</u> උපකරණ පිළිබඳ ලැයිස්තුවක් සකස් කර තම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක මහතාට ලබා දිය යුතු බවත් පැවසීය.<br>-බිත්තර වී හිඟකමෙදිරි කන්නයේදී ගැටලුවක් වන බවත් පැල විසිරුම් තාක්ෂණය යටතේ වගාව කරන්නේ නම් බිත්තර වී අඩු ප්‍රමාණයකින් වගාව සිදු කළ හැකි බවත් පැවසීය.<br>පැල විසිරුම් තාක්ෂණය යටතේ වගාවකට යොමු වේ නම් නැට්වල අවශ්‍යතාවය ලැයිස්තු මගින් ලබා |

| | | |
|---|---|---|
| ගරු ලේකම් ගැමුණු ගොවි සංවිධානය ආර්.ඩී සෝමරත්න මහතා | - කෘෂිකර්ම උපදේශක මහතුන් පවත්වනු ලබන වැඩසටහන් පිළිබඳව ගොවීන් දැනුවත් කරන ලෙස දැන්වීය. | -ඉදිරියේදී දැනුවත් කිරීම කරණ බව පැවසීය. |

- මාසික ව්‍යාපාර කමිටු රැස්වීමේ දී ගොවි ගැටලු ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම උපදේශක මහතුන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතින බව ත් ගොවි සංවිධානවල නිලධාරීන් රැස්වීම්, මහ සභා රැස්වීම්, කාරක සභා රැස්වීම්, පැවැත්වීමේදී කෘෂිකර්ම උපදේශක මහතුන්ට දැනුම් දිය යුතු බවත් එමඟින් දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය පවත්වා ගත යුතු බවත් තේවාසික ව්‍යාපාර කළමණාකරු පැවසීය.

04.පශු වෛද්‍ය නිලධාරි කාර්යාලයේ අදහස් දැක්වීම

සත්වසංවර්ධන උපදේශක ගල්ගමුව

- සුපුරුදු ව්‍යාපෘති සිදු කරණ බවත් වසංගත රෝග සඳහා සත්ව එන්නත් ලබා දීම සිදු කරණ බවත් පැවසීය.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | ගැටලුව | තීරණය |
|---|---|---|
| ගරු සභාපති යාය 04 ගොවි සංවිධානය එච්.එච් කරුණාරත්න මහතා. | -කිරි ගවයන් මිලදී ගැනීම සඳහා අවස්ථාව ලබා දිය හැකිද යන්න විමසීය. | -අවශ්‍ය සහයෝගය ලබා දිය හැකි බව පැවසීය. |

05.ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අදහස් දැක්වීම

සහකාර කළමණාකරු ගල්ගමුව බැංකු ශාඛාව

- අවුරුදු නවයකට ආසන්න කාලයක සිට වාරි පුබුදු ණය වැඩසටහන ක්‍රියාත්මක වන බවත් ඒ තුලින් තේවාසික ව්‍යාපාර කාර්යාලය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අතර මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරණ බවත් පැවසීය.
- අනෙකුත් ණය සඳහා මෙන් නොව වාරි පුබුදු ණය සඳහා වාර්ෂික පොලී ප්‍රතිශතය 8%ක වැනි අඩු මට්ටමක පැවතියද ණය ඉල්ලීම අඩු බවත් එයට හේතුව ගොවීන් මේ පිළිබද නොදැනුවත් වීමද යන්න විමසීය.ගොවීන්ට මෙය ඉතා වටිනා අවස්ථාවක් බවත් එයින් ප්‍රයෝජන ගැනීම සුදුසු බවත් පැවසීය.තවද වගා කටයුතු පමණක් නොව ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහාද ණය ලබා ගැනීම සිද්ධකල හැකි බවත් ඉතා සරල කොන්දේසි ප්‍රමාණයක් සහිතව ණය ලබා ගැනීමේ පහසුවද පවතින බව පැවසීය.

කළමණාකරු-අඹන්පොල බැංකු ශාඛාව

- මීට පෙර ණය ලබා ගෙන ඒවා සම්පූර්ණයෙන් ගෙවා නොමැති හෙයින් ණය ඉල්ලුම් නොකර සිටී නම් එවැනි අයටද ගෙවීමට ඇති ණය මුදල අඩු කරගෙන නැවත ණය ලබා ගත හැකි බව දැන්වීය. පසුගිය මාසයේ ව්‍යාපාර කමිටුව හරහා කල දැනුවත් කිරීම වලින් පසුව සතුටුදායක ප්‍රගතියක් ලගා කරගෙන ඇති බවද පැවසීය.

ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ

| ඉදිරිපත් කළ අය | ගැටලුව | තීරණය |
|---|---|---|
| ගරු සභාපති පුරාණගම | තමාගේ වයස අවුරුදු 75ක් පමණ වන | දරුවකු හරහා බද්ධ ගිණුමක් |

| | | |
|---|---|---|
| ගොවි සංවිධානය ටී.බී හේරත්බණ්ඩා මහතා. | බවද අක්කර දෙකක පමණ රටකජු වගාවක් සිදු කිරීමට අපේක්ෂා කරණ බවත් ඒ සඳහා ණය ලබා ගත හැකිද යන්නත් විමසීය. | මගින් ණය ලබා ගත හැකි බව අඹන්පොල ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කළමණාකරු පැවසීය. |

- මෙම ව්‍යාපාරය අති දුෂ්කර එකක් බවත් කන්න තුනකදීම වගාවක් සිදු නොවීම නිසාත් ගොවීන් දැඩි අපහසුතාවයකින් ජීවත් වන බවත් ණය ලබා ගෙන කුමන හෝ ජීවන රැකියාවක් ආරම්භ කිරීමට යොමු වීම සුදුසු බවත් නේවාසික ව්‍යාපාර කළමණාකරු පැවසීය.

වෙනත්-:

සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පිළිබඳව නේවාසික ව්‍යාපාර කළමණාකරු ව්‍යාපාර කමිටුව තුලින් විමසා සිටීම.

එහිදී පුරාණගම ගොවි සංවිධානයේ ගරු ලේකම් බී.එම් බාලසූරිය මහතා විසින් පවසා සිටියේ සහනාධාර වැඩසටහන සඳහා ගොවීන් තෝරා ගත් ආකාරය කිසිදු ප්‍රතිපත්තියක් නොමැති බවයි.
ඊට අදාලව යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති පී.එම් ප්‍රියානන්ද වීරසිංහ මහතා පැවසුවේ එකල්බණ්ඩලට අදාලව සහනාධාර ලැබිය යුතු අය තෝරා ගත් බවත් ඒ සඳහා කමිටුව සහයෝගය ලබා දුන් බවත්ය.

අනතුරුව අද දින ව්‍යාපාර කමිටුව සාර්ථකව පැවැත්වීම සඳහා සහයෝගය දුන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් ප.ව 12.30ට පමණ ව්‍යාපාර කමිටුව අවසන් කළ අතර මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2017 සැප්තැම්බර් මස 22 වන දින පෙ.ව 9.00ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන් විසින් රැස්වීමේ කටයුතු අවසන් කරණ ලදී.

නේවාසික ව්‍යාපාර කළමණාකරු
මී ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

**බී.එම්.කේ.එච්. දිසානායක**
**නේවාසික ව්‍යාපාර කළමනාකරු**
**මීඔය / උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය,**
**ගල්ගමුව.**

පිටපත්:-

| | |
|---|---|
| 01.දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල | :-කාදැස |
| 02.වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ | : කාදැස |
| 03.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල | :-අවශ්‍ය කටයුතු සදහා |
| 04.ප්‍රාදේශීය ලේකම් ගල්ගමුව/අඹන්පොල/ ඇහැටුවැව | :-අවශ්‍ය කටයුතු සදහා |
| 05.ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව | :-අවශ්‍ය කටයුතු සදහා |
| 06.ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කුරුණෑගල | :-අවශ්‍ය කටයුතු සදහා |
| 07.ගොවිජන සංවර්ධන නිලධාරී ගල්ගමුව/අඹන්පොල ඇහැටුවැව/නාන්නේරිය | :-අවශ්‍ය කටයුතු සදහා |
| 08.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ගල්ගමුව කලාපය | :-අවශ්‍ය කටයුතු සදහා |
| 09.සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය මහව | :-අවශ්‍ය කටයුතු සදහා |
| 10.කෘෂිකර්ම උපදේශක පාලුකඩවල/අඹන්පොල වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය | :-අවශ්‍ය කටයුතු සදහා |
| 11.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගල්ගමුව | :-අවශ්‍ය කටයුතු සදහා |